ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

# වෙසක් මංගල්‍යය නිමිත්තෙන් පැවැත්වෙන ඉන්දියාවේ බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය දෙරට අතර ශිෂ්ටාචාරමය බැඳීම අවධාරණය කරයි

බුද්ධ රශ්මි ජාතික වෙසක් උළෙලට සමගාමීව කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ විශේෂ ප්‍රදර්ශනයක් කොළඹ,ගංගාරාම විහාරයේ සීමා මාලකයේ දී සංවිධානය කර ඇත.

2. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් සමඟින් 2023 මැයි 3 වන දින ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගංගාරාම විහාරය විසින් ඒකාබද්ධව සංවිධානය කරනු ලබන මෙම වෙසක් උළෙලේ පූර්ව විවෘත කිරීම සඳහා සහභාගී විය. වෙසක් පොහෝ දින සිදු වූ බුදුන් වහන්සේගේ ඉපදීම, බුදු වීම සහ පිරිනිවන් පෑම සමරමින් සංවිධානය කරන ලද මෙම විශේෂ ප්‍රදර්ශනය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ශිෂ්ටාචාරමය බැඳීම අවධාරණය කරයි.

3. බුදුන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිදුවීම් සහ ජාතක කතා නිරූපිත, යුනෙස්කෝ උරුමයක් වන ලෝ සුපතළ අජන්තා ලෙන් සිතුවම් හි ඩිජිටල් ප්‍රතිනිර්මාණ මෙම ප්‍රදර්ශනයට ඇතුළත් කර ඇත. අජන්තා ලෙන් ක්‍රිස්තු පූර්ව දෙවන සහ පළමුවන සියවසට අයත් අතර ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රදේශයේ පිහිටා ඇත.

4. මෙම ප්‍රදර්ශනය ඉන්දියාව ඉන්දියාවේ සහ ලොව පුරා බෞද්ධ උරුමය රැක ගැනීමට සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමට ගන්නා අප්‍රතිහත ප්‍රයත්නයන් සඳහා තවත් සාක්ෂියකි. ප්‍රදර්ශනයේ භාරකරුවන් වන අනුක් නායික් මහතා සහ ප්‍රසාද් පාවර් මහතා නියම බැසෝල්ට් (basalt) පාෂාණයක් මත ඩිජිටල් වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කරන ලද සුපතළ

“පද්මපානි” පද්මයේ අනුරුවක් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත තිළිණ කළහ. මෙය අජන්තා ලෙන් හි සිදු කෙරෙන මහාර්ඝ ප්‍රතිෂ්ඨාපන කටයුතු සඳහා අගනා නිදසුනකි.

5. මෙම ප්‍රදර්ශනය 2023 අප්‍රේල් 20-21 දිනවල ඉන්දියාවේ නව දිල්ලි හි පැවති ප්‍රථම ගෝලීය බෞද්ධ සමුළුවේ දී ද පැවති අතර අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ද එය නැරඹීමට එක් විය.

6. ප්‍රදර්ශනය 2023 මැයි 5-7 දක්වා මහජනතාව සඳහා විවෘතය.

***

**කොළඹ**
**2023 මැයි 4**